

# සුනිල් සරත් පෙරේරා...... සුවිශේෂයි

**ආචාර්ය පියසෝම මේදිස්**

සිංහල ගී ප්‍රබන්ධය, කාව්‍යකරණය, ගද්‍ය ප්‍රබන්ධය, පරිසර සංරක්ෂණ සංනිවේදනය, සාහිත්‍ය විචාරය, මාධ්‍ය ගරාජ්‍ය පරිපාලනය වැනි විවිධ ක්ෂේත්‍රයන්හි ඉණිමං පාමුල සිට ඉහළටම ගොස් සුපුරුදු සන්සුන් ගුණයෙන් නිහතමානීව, විශ්‍රාමයෙන් තවමත් ගී හඳ කලා සේවයේ නියැලි සුනිල් සරත් පෙරේරා සහෘදයා පිළිබඳ මෙවැන්නක් ලියන්නට හැකිවීම සතුටකි.

එමෙන්ම සිංහල උරුමය රැකීමේ උදාර අරමුණින් තම මනසත්, ගතත් තවම යොමු කොට ඇති සුනිල් වෙනුවෙන් මෙල්බන් නුවර "එරන්දතිය එනවා" නමින් විශේෂ සුනිල් සරත් ගී සන්ධ්‍යාවක් මැයි 08 දා පැවැත්වීමට කටයුතු යෙදී තිබීමද විශේෂයෙන් අගය කළ යුතුය. එක අතකින් එය දශක පහකට අධික කාලයක් තිස්සේ අපේ අමන්දානන්දයට විවිධ ගී ලියූ අපේම විශිෂ්ඨයකුට දක්වන උත්තමාචාරයක් වැන්න. එමෙන්ම ඔහුගේ ගී ඔහු ඉදිරියේම අපේ ශිල්පීන් විසින් ගැයීමෙන් සුනිල් සරත් පිළිබඳව මෙහි වසන ඔසි සිංහලයින්ගේ රාවය කුමක්ද යන්න අප ජාතියට ඒත්තු ගැන්වීමක්ද වැන්න. ඇත්ත වශයෙන් සුනිල් වැනි සුභාවික ගී රචනයේ නිපුන් ප්‍රමුඛයින් බිහිවන්නේ ඉතා කලාතුරකිනි. එහෙයින් මගේ හැඟීම අනුව සුනිල් ජාතික සම්පතකි. එවැන්නකුට උපහාරයක් දැක්වීම අපේ යුතුකමකි.

සුනිල් සරත් ගී රචනා කිරීමට යොමුවූයේ හැව්ලොක් ටවුමේ ලුම්බිණී මහා විද්‍යාලයේ ඉගෙනුම ලබන අවධියේ තරුණ ශිෂ්‍යයෙකුව සිටියදීය. එහි කථිකොදය ශිෂ්‍ය සංගමයේ ලේකම් වශයෙන් කටයුතු කරන අවධියේ ගීයක් ප්‍රබන්ධ කරන්නට අවස්ථාව ලැබුණි. එහිදී ඔහු එදා ගී පබැඳීමේ සිරිත අනුව හින්දි ගීයක් අනුව පබැඳුමක් කළේය. එවක ඉතා ප්‍රසිද්ධ හින්දි චිත්‍රපටියක් වූ 'දිල් ආප්නා ඕර් ප්‍රිත් පරාණා' හි එම වචන යුත් වූ ගීය අනුව යමින්

"මහවැලි ගංගා කොමලියෙ ඔබ සලු පට සලලා යන්නේ කොයිබද ?" යන ගීය නිර්මාණය කළේය. එයින් සුනිල් සරත් පෙරේරා තමා සම්මානනීය ගී ප්‍රබන්ධකයාගේ බිහිවීම සිදුවිය. එම ප්‍රථම ගීයෙන් පසු ගී ප්‍රබන්ධය කෙරෙහි වැඩියෙන් යොමුවන්නට විය. "නීල කේශී", " බැඳගත් බෙරේ" වැනි ගීත නාටක ඔහු අතින් ලියැවී නිශ්පාදනය වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

කෙසේ වුවද සිංහල ගී ප්‍රබන්ධකරණයේ ගමන් මගේ විශාල වෙනස්කම් ඇතිවන්නට විය. ඒ 1950, 1960 දශක වල හින්දුස්ථාන ගී වලට පද යොදනු වෙනුවට අපේ උරුමයේ වැදගත්කම අනුව යමින් ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, මඩවල එස් රත්නායක, මහගම සේකර වැනි ශ්‍රේෂ්ඨයෝ ඒ අනුව අපට හුරු බස් වහර යොදා ගනිමින් ගී පද රචනා කළෝය. ඒ ක්‍රමවේදය ජනගතවීම වේගයෙන් සිදුවුණි. එහි සුවඳින් හමා ආ අමා සුළඟින් සුනිල් තුල ඇති වූයේ එම යමින් ගී පබැඳීම අනවරතයෙන්ම කළ යුතු බවය. ඒ අනුව ඔහු ගී ලියා ගිනිමින් එවක ගුවන් විදුලිය ඉදිරියේ වූ කොට තාප්පය වෙත ගොස් තමන් ලියූ ලී එහි වැඩිහිටි සිංහල වැඩසටහන් නිශ්පාදකයින්ට දීම තම ජීවන චර්යාවේ අනිවාර්ය අංගයක් කොට ගතිඑම උත්සාහය 1960දී බෙහෙවින් සාර්ථක විය. තමන් ලියූ "කොට්ටෝරුවො ඇයි හොරේ" ගීය කරු අයියා (කාරුණාරත්න අබේසේකර) තමාගේ වැඩ සටහනට තෝරා ගත් "මිණි කිකංකිණි" දැක්වූ සුනිල් ඉමහත් ප්‍රීතියට පත්වූ බව මා මෙහි සඳහන් කරනුයේ සහෘද ගෞරවයෙන්. එම ගීයට තිලකසිරි ප්‍රනාන්දු සංගීතය සැපයූ අතර ලාලනී සෝමසිරි එම ගීය ගැයූවාය. ඉන් සුනිල්ට ගුවන් විදුලියේ දොරටු විවෘතවූවාක් මෙන්ම අපට ඔහු අතින් ලියැවුණු ගී දහස් ගණනක රසය ලබා ගැනීමට හැකිවූ බව අමුතුවෙන් කිව යුතු නොවේ.

එදා පටන් සුනිල්ගේ දකුණු අතේ ඇඟිලි තුඩුවලටත් පෑනටත් විවේකයක් ලැබුණේයයි මම නොසිතමි. ඔහුගේ ජීවන රටාව වූයේ ගීයයි, ලිවීමයි. ගෙදරදීත්, කාර්යාලයේදීත් බසයේදීත් ගී ලීවේය. ගී ප්‍රබන්ධ කළ වැඩිහිටියන් මුණ ගැසී ගී ගැන කථා කළේය. ගම් නියම් ගම් කර ගොස් ආදී වාසීන්, පතල් කරුවන් ආදීන් වෙත ගොස් අපේ කම අවබෝධ කරගත්තේය. ඒ නිසා ඔහුට තම ගී රචනා තුළින් අපේකම පිළිබඳ නියත රූප මවා අප ප්‍රමුදිත කිරීමට ඔහුට පුළුවන් විය. එයට මූලික හේතුව වන්නේ ඔහුගේ ගී විශේෂයෙන් අර්ථ රසයෙන් පරිපූර්ණ වී තිබීමය. ඇත්ත වශයෙන් ගීයක මූලික හරය එයයි. ඔහු අතින් ලියවී ඇති ගී මාගේ දැනීම අනුව සුවිශේෂ වන්නේ ඒවායේ ඇති සංවේදීතාව, කලාත්මක ශික්ෂණය ස්වතන්ත්‍ර නිර්මාණ ගුණය, සහජ ප්‍රතිභාව, සෞන්දර්යාස්වාදය, විධිමත් නොවිධිමත් ජන ජීවන අධ්‍යනය වැනි මූලික හේතූන් නිසාය.

එමෙන්ම ගී පද ප්‍රබන්ධයේ පාණ්ඩිත්‍යභාවය ඇති කරගැනීම ක්ෂෙත්‍ර හතරන් කෙරෙහි සමාධිගත අවධානය යොමු කළ යුතු බව මගේ විශ්වාසයයි. ඉන් පළමුවැන්න පරිපූර්ණ භාෂා ඥාණයයි. දෙවැන්න ජාතිනානු රාගයයි. නැතිනම් දේශානුරූපීත්වයයි. තෙවැන්න දේශාලයයි. සතරවැන්න කාව්‍ය රස පිලිබඳ විඥානාත්මක දැනුමයි. සුනිල්ගේ තේමා පද කියවීමේදී මා පැහැදිලිවම ක්ෂෙත්‍ර හතරේ සුසංයෝගය එම පැහැදිලිවම දකිමි. ඇත්ත වශයෙන් එය දුලබ වාසනාවකි. අරුම හැකියාවකි. සුනිල් සරත් සුවිශේෂයයි නිතරම එම හැඟෙන්නේ එහෙයිනි.

සුනිල් සරත් ගී ප්‍රබන්ධයේ හිනි පෙත්තට ගියේ ස්වඋත්සාහයෙනි. එ නිසා ඔහුගේ මනස විවිධ පැති කෙරෙහි යොමු වන්නට විය. මෙහිදී මාහට මූලිකව පෙනෙනුයේ දාර්ශනික කවිතාව අනුව ගී ලිවීමට දක්වා ඇති උනන්දුවයි. ඔහු ඒ මග යමින් ලියා ඇති ගී වල බුදු සමය මගින් ලද ශික්ෂනය සුනිල් මෙම හුරුවට ලියූ ගී තුල වෙනස් වීම නිත්‍යතාව ඉස්මතුව පෙනෙන අයුරු මම දකිමි. " මේ මහ කන්ද" "පෙරදිනයක මා පෙම් කළ යුවතිය" "හැන්දෑ අහසේ" ගීත මෙයට සාක්ෂිය දේශානුරාගී ගී වලින් අපේ මනෝභාවයන් තුටු කරන ගී රැසක් සුනිල් අපට නිමි කොට දී ඇත. " පියාසර කර ආමි" "මගේ රටට දළදා හිමි සරණයි" "සීගිරි ලෙන්දොර" "සිරි සමනොල සිරසින්" වැනි ගී අප තුළ දැවන්නේ අපූරු හැගීම් බව කිව යුතුය. අනිවාර්යයෙන්ම පරිසර වාදියෙක් වන සුනිල් ඒ බව නිතර තම ගීවලින් දක්වාලීය. " අලුත් ඉරකි පායන්නේ " "ආවේ ජාතිය නගාලන්නට" "සිංහල ලකුණ මෙයයි පෙන්වා" වැනි ගී වලින් ඔහු ඇති කරන ජාතිකානුරාගය අප අගය කළ යුත්තකි.

සුනිල් තේමා ගී රැසක් ද අප ජාතියට හිමිකොට දී ඇත. මහබැංකු ගීය ගුවන් විදුලියේ ළමා පිටියේ " මනකල් හද විල් තලයේහි ගීය" ජාතික ක්‍රීඩා ගීය සිරිමාවෝ බාලිකා විද්‍යාලයයීය ගීය ඒවායින් සමහරකි.

විශේෂයෙන් අභිනන්ද ගී, සමරු ගී, උපහාර ගී රැසක් ද සුනිල් අතින් ලියැවී ඇත. ලංකා කොමියුනිස්ට පක්ෂයේ නායකයාව සිටි දොස්තර එස්. ඒ. වික්‍රමසිංහ මහතා අභාවප්‍රාප්ත වූ වේලෙහි ලියූ "නිල්වලාවෝ" ගීය මෙහිදී මුලින්ම මාගේ මතකයට එන්නකි. එමෙන් ලංකා සම සමාජ පක්ෂයේ නායකයාව සිටි ආචාර්ය එන්.එම්. පෙරේරා මියැදුන අවස්ථාවෙහි ලියූ "සූරිය මල ශ්‍රියා" ගීයත් "සොහොයුරාණනි" ඔබේ නාමෙන් හෙටත් සූරිය මල් පිපේවි ගීයත් විශිෂ්ඨ නිර්මානයක්ය. එවක ශ්‍රී ලංකාවේ ජනාධිපතිව සිටි ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ඉල්ලීම මත ප්‍රවෘත්ති අමාත්‍ය ආනන්ධ තිස්ස ද අල්විස් මහතාගේ මෙහෙයවීමෙන් එම එසැන ගීත ද්වය ලියූවද එවකට සුනිල් සේවය කළ ජාතික බැංකුවේ ප්‍රධානියා ඒ මහඟු කාර්යය කිරීම සම්බන්ධයෙන් දේශපාලන කෝණයකින් බලා සුනිල්ගේ වැඩ තහනම් කළ බව මෙහිලා දක්වන්නේ කණගාටුවෙනි පුදුමය. ජනාධිපතිතුමාටත් එම තීරණය වෙනස් කරන්නට නොහැකිවීමය. සුනිල් අතින් නිර්මාණය වී ඇති අභිනන්ද ගී අතුරින් එකක් පමණක් මම මෙහිදි සඳහන් කරමි. මා එය කරණුයේ ඕස්ට්‍රේලියාවේ වසන අපටද වැදගත්වන හෙයිනි. එම ගීය සැනෙන් නිර්මාණය වූයේ සිඩ්නි ලංකාරමාධිපති පූජ්‍යපාද රාජකීය පණ්ඩිත මීගහකුඹුරේ ධම්ම ගවේසී හිමිපාණන්ට මල්වතු පාර්ශවයීය ඕස්ට්‍රේලියාවේ සංඝනායක හිමියන් වශයෙන් අක්තපත්‍ර ප්‍රදානය කිරීම සම්බන්ධයෙනි. සංඝ ගෞරව පූර්වකව ශාන්ත හා කරුණා රසයන්ගෙන් පිරි මම ගිය ඉතා විශිෂ්ඨ අභිනන්ද ප්‍රබන්ධයකි. "ධම්ම ගවේසි සුශිල ගුණධර ගරුතර නා හිමි මීගහකුඹුරේ" යනුවෙන් ගැයෙන එම ගීය පුණ්‍යකාමී එකකි.

සුනිල්ගේ සමරු ගී අතර අමතක නොහැකි ගීයක් ඇත. එය ආරම්භ වනුයේ "සෙනෙහස විලෙන් දිය දෝතක් පෙව්වාය" යනුවෙන් ඇති එම ගීය ලියවුණේ ඔහුගේ ජීවිත පහන් තරුව වූ මුර දේවතාවිය වූ විවාහ වූ දින පටන් ඔහුගේ සෙවැනැල්ල මෙන් නිතර ලඟින් පෙම්මාදර බිරිය වූ සරෝජනිය වෙනුවෙනි. එම ගීය පරිපූර්ණ ගීයක් වශයෙන් එම අගයමි. නිතර අසමි. බිරිඳකට කළ යුතු පූජෝපහාරය එය මැනවින් ධ්වනිත කරන අතර එම ගීය කියවන විට ස්වාමි පුරුෂයකුගේ නෙත් තෙත් නොවන්නේ නමු පුදුමයකි.

සුනිල් ආගමික නැඹුරුවක් ඇති ලියා ඇති ගී බෙහෙවි. විශේෂයෙන් 2600 සම්බුද්ධත්ව ජයන්ති වෙනුවෙන් ලියූ බුද්ධ පූජෝපහාර ගීය අග්‍රහණය එකකි. ඔහු ලියූ බොදු බැති ගී අතුරෙන් "නිරාමිෂ ගුණ හද" "සනරාමර හිමි දම්සක් දෙසුවො" යන ගී විශේෂයෙන් වැදගත් වේ. කිතුණු ගීත ලිවීමටද සුනිල් අමතක කළේ නැත. බෞද්ධයෙක් විසින් රචිත ගීයක් ලංකාවේ කිතුනු ගී පොතට ඇතුලත් වී ඇත්තේ නම් ඒ සුනිල් ලියූ "බාලොලි" යන ගීයය. එමෙන් නත්තල වෙනුවෙන් ඔහු ලියූ ගීයද වැදගත්.

ඇත්ත වශයෙන් සුනිල්ගේ ගී ප්‍රයත්නයන් ගැන පිටු ගණන් ලියවිය හැකිය. එම ගී ආචාර්ය උපාධියක් අධ්‍යයන කරන්නෙකුට කොෂඨාගාරයකි. ඔහු තව තවත් ගී, ගද්‍ය, පද්‍ය, විචාර යන ක්ෂෙත්‍රයන්ට යොමුව ලියන ඇතැයි මගේ විශ්වාසයයි.

සුනිල් ඕස්ට්‍රේලියාවේ වසන අපි ඔබ සමඟයි. අප ඔබ සමඟයි. රැකියාවට යනවිට තට්ටු දෙකේ බස් රථයේ උඩ තට්ටුවේ හිදිමින් බසයේදී ලද ටිකට් පතෙහි ලියූ "එරන්දතිය එනවා" සමඟ සුනිල් අපි ඔබ හමුවන්නෙමු.

## සුනිල් සරත් - මතක සටහනක්

**ජගත් ජේ එදිරිසිංහ**

හැත්තෑව දශකය අගභාගයේ පමණ ශ්‍රී ලංකා ගුවන් විදුලියේ ජනප්‍රිය වැඩසටහන් පෙළක් සෑම දිනකම සවස ගුවන් ගත විය. ප්‍රේමකීර්ති ද අල්විස් වැනි ජනප්‍රිය නිවේදකයන් විසින් දිනපතා ඉදිරිපත් කරන ලද එම සවස වැඩසටහන නම් කර තිබුණේ "සොඳුරු සෙවණ" ලෙස යයි මගේ මතකය කියයි. ඉතා රසවත් හරවත් වැඩ සටහන් පෙළක් වූ සොඳුරු සෙවණට සවන් දෙන්නට එවකට පාසල් සිසුවකු වූ මම පුරුදුව සිටියෙමි. සතියේ දවස් පහේ වැඩසටහන් අතරින් මගේ සිත වඩාත් ඇදී ගියේ අඟහරුවාදා සොඳුරු සෙවණටය. අඟහරුවාදා සොඳුරු සෙවණ ඔස්සේ කවි නිර්මාණ ඉදිරිපත් කෙරුණ අතර සුනිල් සරත් පෙරේරා නම් තරුණ ජනප්‍රිය ගීත රචකයා මේ කවි නිර්මාණ සාකච්ඡාවට ගත්තේය. එවකටත් කවියට ලොල්ව සිටි මම මෙම වැඩසටහනට මගේ කවි නිර්මාණ ලියා යවමින් සිටියෙමි.

සුනිල් සරත් එවකට සේවය කරමින් සිටියේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රචාරක අංශයේ ය. මගේ පියා ද ඔහු සමග සේවය කළ නිලධාරියකු විය.

"තමුසෙ සුනිල් සරත්ගෙ වැඩ සටහනකට කවි යවනවද?" එක්තරා සවසක තාත්තා මගෙන් ඇසුවේය.

"ඔව්" මම හොරයක් අසුවූ කලෙක මෙන් ඇඹරෙමින් කීවෙමි. කිසිදු විශේෂ හේතුවක් නැතිවම හැමදාමත් මා ලිව්වේ ගෙදර කිසිවකුට නොපෙනෙන ලෙස හොරෙන් ය.

"කවි හොඳයි කිව්වා.. ඇවිත් මුණ ගැහෙන්න කියල සුනිල් සරත් කිව්වා.." තාත්තා මට කිරුළපනේ මායා ඇවනිව්හි පිහිටි සුනිල් සරත් පෙරේරා මහතාගේ ගෙදර ලිපිනයද දුන්නේ ය.

සතියකට පමණ පසු දිනෙක මම මායා ඇවනිව්හි සුනිල් සරත් පෙරේරා මහතාගේ නිවසට ගොඩවීමි. ඔහු මා සාදරයෙන් පිළිගෙන සාලයේ අසුනක වාඩිවෙන්නට සළස්වා මා ලියූ කවි කීපයක් ගෙන ඒවායේ ඇති ගුණ දොස් පෙන්වා දුන්නේ ය. (ඒ අතරේ පෙරේරා මහත්මියගේ තේ පැන් සංග්‍රහයද භුක්ති වින්දෙමි)

ඉතා ආධුනික කවියකු වූ මා ලියා තිබූ දේශාභිමානී කවියක් සුනිල් සරත් නිවැරදි කළ අයුරු මගේ මකතයේ තවමත් ඇත.

**රන් හිරු පායයි රන්කෙත් යායයි රන්වැලි මහ සෑයයි**
**මහාවැලී මහ ගඟ උතුරා එන නිවහල් දෑ ගීයයි**

ඔහුගේ අත් අකුරින් නිවැරදි කළ මේ කවිය බොහෝ කාලයක් තිස්සේ ප්‍රවේසම් කරගෙන සිටියද ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වන කලබලයේදී එය අවතැන්ව යාම අදටත් සිතේ ඇති කරන්නේ දුකකි.

අපේ හමුවෙන් අනතුරුව ගුවන් විදුලියේ සොඳුරු සෙවණ වැඩ සටහන ඔස්සේ මගේ කවි කීපයක් සාකච්චාවට ගන්නටද ඔහු අමතක නොකළේය. අධුනික කවියකුට එයටත් වඩා අත්වැලක් ඇවැසිවේද?

සුනිල් සරත් පෙරේරා කලාකාරුවාණනි. ඔබට ස්තුතියි.